බදු ගෙවන්නන් වෙත කෙරෙන නිවේදනයයි

අත්තිකාරම් ආදායම් බද්ද (AIT)
රඳවාගැනීමේ බද්ද (WHT)
අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT)

2026, ඔක්තෝබර් මාසය තුළ රඳවාගත් බදු,
2026, නොවැම්බර් 15 හෝ එදිනට පෙර ගෙවීමට කටයුතු කරන මෙන් කරනු ලබන සිහිපත් කිරීමයි.

ගෙවීම් පිළිබඳ විස්තර **බදු වර්ගය සඳහා කේතය** සහ **ගෙවීම් කාල කේතය** පහත දක්වා ඇත.

බදු වර්ගය	බදු වර්ගය සඳහා කේතය	ගෙවීම් කාල කේතය	ගෙවීම් වර්ගය
පොලිය මත අත්තිකාරම් ආදායම් බද්ද (AIT)/ රඳවාගැනීමේ බද්ද (WHT)	43	26100	S
ගාස්තු සහ වෙනත් ගෙවීම් මත අත්තිකාරම් ආදායම් බද්ද (AIT)/ රඳවාගැනීමේ බද්ද (WHT)	44	26100	S
අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT)	03	26100	S

- නියමිත බදු මුදල මාර්ගගත බදු ගෙවීමේ පහසුකම (OTPP) මගින් ගෙවීමට කටයුතු කරන ලෙස දන්වනු ලැබේ. කරුණාකර වැඩිදුර විස්තර සඳහා https://www.ird.gov.lk/en/publications/SitePages/Online_Pay_OTP.aspx?menuid=141601 සහ User Guide for Online Tax Payments Platform (OTPP) වෙත පිවිසෙන්න.
- එසේම, **APIT** සඳහා ගෙවීම **ලංකා බැංකුවේ** ඕනෑම ශාඛාවක් මගින් ද **AIT/WHT** සඳහා ගෙවීම **මහජන බැංකුවේ** ඕනෑම ශාඛාවක් මගින් ද සිදුකළ හැකිය.
- බැංකු ශාඛාවක් මගින් ගෙවීම් කිරීමේ දී ගෙවීම නිවැරදිව සිදු කිරීම සඳහා අවශ්‍ය වන **DIN (Document Identification Number)** අංකය https://eservices.ird.gov.lk/Payment/PayingInSlip/Index සබැඳිය වෙත පිවිසීමෙන් හෝ **0112134780** දුරකථන අංකය ඇමතීමෙන් ලබාගෙන ගෙවීම් පත්‍රිකාවේ "**ගෙවීම් වවුචර් අංකය**" යටතේ සඳහන් කරන්න.
- බදු නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම සඳහා දණ්ඩන පනවනු ලබන බව කරුණාවෙන් සලකන්න.
- බැංකු අණකරයකින් හෝ ගෙවීම් ඇණවුමකින් කරනු ලබන ගෙවීමක් නියමිත දිනය පසු වී උපලබ්ධි වීම ද ප්‍රමාද ගෙවීමක් ලෙස සලකනු ලැබේ.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්